දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.


මගේ අංකය / எமது இல. / My No. } ED/4/60/02/ගුරු ඉල්ලීම්

දිනය / திகதி / Date } 2014.02.

චක්‍රලේඛ අංක - 03/2014

සියලුම පළාත් ලේකම්වරුන්

සියලුම පළාත් අධ්‍යක්ෂවරුන්

සියලුම කලාප අධ්‍යක්ෂවරුන්

**<u>ශ්‍රී ලංකා විදුහල්පති සේවයට බඳවාගත් නිලධාරින්ගේ වැටුප සකස් කිරීම</u>**

ශ්‍රී ලංකා ගුරු සේවයේ සිට ශ්‍රී ලංකා විදුහල්පති සේවයට පත්වූ නිලධාරින්ගේ වැටුප් විෂමතාව සම්බන්ධයෙන් 2013.10.03 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුකූලව 2000.08.04 දින සිට ශ්‍රී ලංකා විදුහල්පති සේවයට පත්වූ නිලධාරීන්ගේ වැටුප පහත සඳහන් පරිදි සකස් කිරීමට තීරණය කර ඇත.

01.) වැටුප සකස් කිරීම

1.1) ගුරු සේවයේ ලබමින් සිටි වැටුප විදුහල්පති සේවයට අදාළ වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුපට අඩුනම් ඔහු එම වැටුප් පරිමාණයෙහි (ශ්‍රී.ලං.විදු.සේ) අදාළ ශ්‍රේණියේ ආරම්භක වැටුප් පියවරෙහි තබනු ඇත.

1.2) ගුරු සේවයේ ලබමින් සිටි වැටුප විදුහල්පති සේවයට අදාළ වැටුප් පරිමාණයෙහි වැටුප් පියවරකට අනුරූප වේනම් ඔහු එම වැටුප් පියවරෙහි තබනු ඇත.

1.3) ගුරු සේවයේ ලබමින් සිටි වැටුප විදුහල්පති සේවයට අදාළ වැටුප් පරිමාණයෙහි වැටුප් පියවරවල් අතරෙහි ගැනේනම් විදුහල්පති සේවයට අදාළ වැටුප් පරිමාණයෙහි ඉහළ වැටුප් පියවරෙහි තබනු ඇත.

02.) වැටුප් වර්ධකය සකස් කිරීම

2.1) ගුරු සේවයේ ලබමින් සිටි වැටුප් වර්ධකය විදුහල්පති සේවයේ බඳවාගත් ශ්‍රේණියට අදාළ වැටුප් පරිමාණ යටතේ හිමිවන වැටුප් වර්ධකයට අඩුනම් සහ නිලධාරියා විසින් තවදුරටත් වැටුප් වර්ධක උපයා ගනීනම් විදුහල්පති සේවයේ අදාළ වැටුප් පරිමාණයේ (ශ්‍රී.ලං.විදු.සේ) වැටුප් වර්ධකය හිමිවේ.

2.2) ගුරු සේවයේ ලබමින් සිටි වැටුප් වර්ධකය විදුහල්පති සේවයට අදාළ වැටුප් පරිමාණයේ වැටුප් වර්ධකයට සමාන වන්නේනම් සහ නිලධරයා විසින් තව දුරටත් වැටුප් වර්ධක උපයා ගනීනම් විදුහල්පති සේවයේ බඳවාගත් ශ්‍රේණියට අදාළ වැටුප් වර්ධකය ලබාගත යුතුය.

2.3) ගුරු සේවයේ ලබමින් සිටි වැටුප් වර්ධකය විදුහල්පති සේවයේ වැටුප් වර්ධකයට වඩා වැඩි වැටුප් වර්ධකයක්නම් ලබමින් සිටි වැටුප් වර්ධක අගය හා විදුහල්පති සේවයේ බඳවාගත් ශ්‍රේණියට අදාළ නව වැටුප් වර්ධක අගය අතර වෙනස ''ගැලපීමේ දීමනාව''වශයෙන් ඔහුට පෞද්ගලික වන සේ අඩු මූල්‍යමය අගය සහිත වැටුප් වර්ධකය (විදුහල්පති සේවයට අදාළ වැටුප් වර්ධකය) සමග, ඔහු වෙනත් ශ්‍රේණියකට උසස්වීම හේතුවෙන් හෝ වෙනත් කිසියම් හේතුවක් මත ඉහළ හෝ සමාන මූල්‍ය අගයකින් යුතු වැටුප් වර්ධකයකට හිමිකම් ලබන තෙක් වැටුප් වර්ධක ගෙවිය යුතුය. මෙම ''ගැලපීමේ දීමනාව'' සියලු කාර්යයන් සඳහා වැටුපෙහි ඇතුළත් කොටසක් වශයෙන් සැලකිය යුතුය.

03.) ශ්‍රී ලංකා විදුහල්පති සේවයට පත්වන අවස්ථාවේ ශ්‍රී ලංකා ගුරු සේවයේ ලබමින් සිටි වැටුප ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ අදාළ ශ්‍රේණියේ උපරිම වැටුප් තලය ඉක්මවා සිටියේනම් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ අදාළ ශ්‍රේණියේ උපරිම වැටුප් පියවරට විදුහල්පති සේවයේ එම ශ්‍රේණියට නියමිත වැටුප් වර්ධක අගය එකතු කරමින් ඉහත 01 හි 1.1,1.2 හා 1.3 සහ 02 හි 2.1,2.2 හා 2.3 අනුව වැටුප හා වැටුප් වර්ධකය තීරණය කළ යුතුය. ඉන් අනතුරුව නිලධරයා විසින් වැටුප් වර්ධක උපයා ගනීනම් සාමාන්‍ය කාර්ය සාධනය යටතේ ඊලඟ උසස්වීම සඳහා සේවා ව්‍යවස්ථාවේ නියම කර ඇති නිශ්චිත සේවා කාලය සඳහා පමණක් වැටුප් වර්ධක ගෙවිය හැකිය.

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ වැටුප් ක්‍රමය (රාජ්‍යපරිපාලන චක්‍රලේඛ 06/2006(iv)අනුව,

රු.15995-240x5-330x 5-400x7-645x20-34545

3.1) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 පංතියේ ආරම්භක වැටුප ගෙවන ලද නිලධරයකුට,ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව අනෙකුත් අවශ්‍යතා සපුරා ඇත්නම්, රු.15995/= සිට රු.20495/= දක්වා වැටුප් වර්ධක ගෙවිය හැකි අතර, උපරිම වැටුප රු.20495/= වේ.

3.2) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 වන පංතියේ පත්වීම ලබන දිනට, ශ්‍රී ලංකා ගුරු සේවයේ අවසන් වරට ලද වැටුප් පියවර අනුව, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ වැටුප් පරිමාණයෙහි 3 වන පංතිය යටතේ වූ ආසන්න ඉහළ ශ්‍රේණියට උසස්වීම් නොලැබුවේනම් ලැබෙන වැටුප් තීරුවේ උපරිමය ඉක්මවූ නිලධරයන්ට ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව අනෙකුත් අවශ්‍යතා සපුරා ඇත්නම්, ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව ප්‍රකාරව සාමාන්‍ය කාර්ය සාධනය යටතේ ඊලග උසස්වීම දක්වා ලබාගත හැකි උපරිම වැටුප් වර්ධක සංඛ්‍යාව 10කි.

උදා:- ශ්‍රී ලංකා ගුරු සේවයේ 1පංතියේ රු.23580/= ක මාසික වැටුපක් ලබමින් සිටි නිලධරයකු 2009.11.13 දින ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 පංතියට පත්වීමක් ලද්දේනම් ඔහුගේ වැටුප් පරිවර්තනය පහත පරිදි විය යුතුයි.

i) රාජ්‍යපරිපාලනචක්‍රලේඛ 06/2006(iv) අනුව 2009.11.13 දිනට
ශ්‍රීලං. ගුරු සේවයේ ලද වැටුප :රු.23580/=
2009.11.13 දිනශ්‍රීලං.විදු.සේවයේ 3වනපංතියේ පිහිටුවිය යුතු වැටුප:රු.23795/=
(ශ්‍රීලං.විදු.සේවයේ 3
පංතියේඋසස්වීම්නොලදතීරුවයටතේතවදුරටත්වැටුප්වර්ධකගෙවීමෙන්)

ii) 2009.11.13 දිනටශ්‍රීලං.ගුරු සේවයේ වැටුප් වර්ධක අගය :රු. 645/=

iii) 2009.11.13 දිනට ශ්‍රී ලං.විදු.සේවයේ වැටුප් වර්ධක අගය :රු. 330/=

iv) වැටුප් වර්ධක වෙනස (රු.645-330) :රු. 315/=

v) එම නිසා 2010.11.13 ට ගෙවිය යුතු වැටුප :රු.23795+රු.330+රු.315

:රු.24440/=

vi) 2011.11.13 දිනට වැ.ව. සමග ගෙවිය යුතු වැටුප :රු.24440+රු.330+රු.315

:රු.25085/=

මේ ආකාරයට වැටුප් වර්ධක 10ක් ගෙවිය හැකි අතර ඊළග ශ්‍රේණියට උසස් නොවුනහොත් 2019.11.13 දක්වා මෙසේ වැටුප ගෙවිය හැක.

04.) මේ සම්බන්ධව මීට පෙර ලබාදී ඇති අමාත්‍ය මණ්ඩල තීරණ හා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ හා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ අනුව මේ දක්වා නිකුත් කර ඇති චක්‍රලේඛ අංක 2010/12,2010/20හි විදුහල්පති සේවයට අදාළ කොටස හා 2011/24 යන චක්‍රලේඛ අවලංගු කර මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

05.) ඉහත පරිදි වැටුප් සකසා ඉදිරි ගෙවීම් කටයුතු කළ යුතු අතර, හිග වැටුප් ගෙවීම සම්බන්ධව මහා භාණ්ඩාගාරයේ උපදෙස් ලබාගෙන ඉදිරියේදී දැනුම්දීමට කටයුතු කරනු ලැබේ.

06.) 2000.08.04 හෝ එදිනට පසුව විදුහල්පති සේවයේ පත්වීම් ලබා දැනට විශ්‍රාම ලබා ඇති නිලධාරීන්ගේ විශ්‍රාම වැටුපද ඉහත පරිදි සකස් කර ගෙවීම් කටයුතු කළ යුතුය.

අනුර දිසානායක
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්-

01.ලේකම්-රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

02.සභාපති-ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව